(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 150.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2026 මැයි 20 බදාදා පූ. භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ බලශක්ති අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය,** ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අර්කම් ඉල්යාස් මහතා,** බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත ජයවීර මහතා,** ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරවින්ද සෙනරත් මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිනිඳු සමන් හෙන්නායක මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා

ගරු ජේ.සී. අලවතුවල මහතා

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු ඔෂානි උමංගා මහත්මිය

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු කුමාර ජයකොඩි මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු තාහිර් මරික්කාර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෙරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

ගරු දිනේෂ් හේමන්ත මහතා

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදන කරන ලදී:—

I

"2026 මැයි 19 දිනැති මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සමට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක්, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

II

"වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා දින නියම කොට න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේදී දැනට අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය පිළිබඳ ඇතැම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් මතු කරනු ලැබූ කරුණු සැලකිල්ලට ගෙන 2025.11.27 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹි තීරණය පරිදි, 'වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා දින නියම කොට න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ වත්මන් ක්‍රියා පටිපාටිය' පිළිබඳ පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය විසින් සවිස්තරාත්මක වාර්තාවක් පිළියෙළ කරන ලදී.

2026.01.14 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙකී වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව ඊට එකඟ වූ කාරක සභාව, මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනු ලැබූ හා උනන්දුවක් දක්වනු ලැබූ මන්ත්‍රීවරයන්ගේ අදහස් ද ලබා ගෙන, මීට අදාළව පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ නිර්දේශ ලබා ගැනීම සුදුසු බවට වැඩිදුරටත් තීරණය කරන ලදී.

ඒ අනුව, 2026.03.04 දින පැවැති පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභා රැස්වීමේදී මේ සම්බන්ධව අදාළ මන්ත්‍රීවරයන්ගේ ද සහභාගීත්වයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය විසින් පිළියෙළ කරන ලද වාර්තාවේ ඇතුළත් දැනට අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය එලෙසින්ම ක්‍රියාත්මක කිරීමට එකඟතාවය පළ කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් වූ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ වාර්තාව 2026.05.08 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී සලකා බලන ලද අතර, එයට එකඟ වූ කාරක සභාව ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දැනුම්වත් කිරීමට කටයුතු කළ යුතු බවට කරන ලද තීරණය ප්‍රකාරව ඉහත කරුණු මෙම ගරු සභාවේ මන්ත්‍රීවරයන්ගේ කාරුණික අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා දින නියම කිරීමේ හා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ වර්තමාන ක්‍රියා පටිපාටියට පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව මෙන්ම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව ද එකඟ වූ බැවින්, එම ක්‍රියා පටිපාටිය ඉදිරියේදී ද එලෙසින්ම ක්‍රියාත්මක කරනු ලබන බවත් වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව, දැනට ක්‍රියාත්මක වන මෙම ක්‍රියා පටිපාටිය මත පදනම්ව ඉදිරියේ දී කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔබගේ සහයෝගය උදක්ම අපේක්ෂා කරමි.”

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ සබරගමුව පළාත් සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කර, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කම්කරු අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) බෙලිහුල්ඔය, මුත්තෙට්ටුවේගම, මහතැන්න, අංක 28/3 දරන ස්ථානයෙහි පදිංචි පී. තිලකරත්න ද සිල්වා මහතාගෙන් ලැබුණු 2025.12.01 දිනැති පෙත්සම ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා විසින් පිළිගන්වන ලදී.

(2) මහ ඉඳුරුව, පොකුණුගම, නෙළුව, අංක 73 දරන ස්ථානයෙහි පදිංචි ටී.ඒ. විජය කුමාර මහතාගෙන් ලැබුණු 2025.12.22 දිනැති පෙත්සම ගරු නිශාන්ත පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) රත්නපුර, මල්වල හන්දිය, මීහිටිය, සුඛිත යන ලිපිනයෙහි පදිංචි එන්.කේ. වක්කුඹුර මහතාගෙන් ලැබුණු 2025.07.26 දිනැති පෙත්සම ගරු සුනිල් රාජපක්ෂ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) බොරළුවගේ අයින, බුත්කන්ද, කොලොන්න වත්ත, අංක 702 දරන ස්ථානයෙහි පදිංචි එච්. ජෝතිපාල මහතාගෙන් ලැබුණු 2025.06.09 දිනැති පෙත්සම ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) කොළඹ 05, උද්‍යාන පාර, ඇන්ඩර්සන් මහල් නිවාස, අංක ජේ/6 දරන ස්ථානයෙහි පදිංචි දොන් දම්ශ්‍රී ලසන්ත කෝරලේවිදානගේ මහතා සහ වෙනත් දහනව දෙනෙකුගෙන් ලැබුණු 2025.10.08 දිනැති පෙත්සම ගරු චන්දන සූරියආරච්චි මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. කල් තැබීම (2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණය):** “මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය”යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(පූ.භා. 11.49 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.56 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

''ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය''යි වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.29 ට ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.)

''ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.43 ට ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.)

විවාදය කල් ගියේ ය. එතැන් සිට විවාදය ඉදිරි දිනක දී පවත්වනු ලැබේ.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුයෙන්, අ.භා. 5.47 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2026 මැයි 21 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.